# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2290/30 - 2022 ජූලි මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2022.07.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78 (XV)(බී) II

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන සහ 139 වන වගන්ති සමග කියවිය යුතු 27 වන වගන්තියේ
(1) වන උපවගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය, ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත් වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින් ඉහත කී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, එකී පනතේ 21 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලැබිය යුතු, ශ්‍රී ලංකා මොරටුව විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වන ලද 2006 නොවැම්බර් මස 03 වන දින අංක 1469/38 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* (කලින් කලට සංශෝධිත පරිදි වූ) පළකරන ලද නියමයේ උපලේඛනය, එහි I වන තීරයේ දැක්වෙන "වාස්තු විද්‍යා පීඨය" යන අයිතමයට අනුරූපව එහි II වන තීරයේ දැක්වෙන "4. සමෝධානික නිර්මාණ අධ්‍යයන අංශය" යන සටහනට ඉක්බිතිව ම (2013 ජූලි මස 19 වන දින අංක 1819/46 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති) පහත දැක්වෙන එකතු කිරීම මගින්, සංශෝධනය කරනු ලැබේ.

"5. පහසුකම් කළමනාකරණ අධ්‍යයන අංශය"

ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත්,
අධ්‍යාපන අමාත්‍ය.

2022 ජූලි මස 25 වැනි දින,
කොළඹ දී ය.

EOG 07-0155